# බෞද්ධ භික්ෂුවගේ යථා ස්වරූපය හෙළිකරන රට්ඨපාල සූත්‍රය

*- මිරිස්වත්තේ විමලඤාණ හිමි -*

මෙම ලිපිය රට්ඨපාල සූත්‍රයේ සමස්ත අන්තර්ගතය පිළිබඳ සංක්ෂිප්ත විමර්ශනයකි. ලිපිය සූත්‍රයේ විකාශනය හා අනුගත වන අතර ඒ හෙයින්ම එහි ආකෘතිය නොවැලැක්විය හැකි ලෙස අවිධිමත්ය. මෙම ලිපියේ පාදක සටහන් ලෙස යොදා ඇති පිටක ග්‍රන්ථ සියල්ල ලංකාණ්ඩුව මගින් ප්‍රකාශිත බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාවට අයත් බව සැලකිය යුතුය.

රට්ඨපාල සූත්‍රය මජ්ඣිමනිකායට අයත් අසූ වන සූත්‍රයයි. මෙම සූත්‍රයේ කථා නායකයා රට්ඨපාල තෙරණුවෝය. උන්වහන්සේ කුරු රට ථුල්ලකොට්ඨිත නම් නියම්ගමෙහි ධනවත් නියම්ගම් ප්‍රධානියාගේ පුත්‍රයාය.[1] ථුල්ලකොට්ඨිතය බ්‍රාහ්මණ වංශිකයන්ගේ ගමක් බවත් එබැවින් රට්ඨපාල බ්‍රාහ්මණ වංශිකයෙක් බවත් සූත්‍රයේ එන කරුණු අනුව පෙනේ.[2] රට්ඨපාල යන්න ඔහුගේ පරම්පරා නාමය බව සිතිය හැකිය.[3] සූත්‍ර පිටකයේ ඇතැම් සූත්‍රයක් නම් කිරීමේ දී එහි කථානායකයා හෝ

---

1. අපදානපාළියේ රට්ඨපාලථේරාපදානයේ රට්ඨපාල ධනවත් කුලයෙක ඉපදුන බවත් කෙළ පිඩක් මෙන් සම්පත් අත්හරින ලද තමන්ට සම්පත් පිළිබඳ ආශාවක් නැති බවත් සඳහන් වේ. අපදානපාළි 1, 112 පිටුව

   *උට්ඨාය අභිනික්ඛම්ම - ජහිතා භොග සම්පදා*

   *ඛේළ පිණ්ඩව භොගමහි - පෙමං මයහං න විජ්ජති*

2. ථුල්ලකොට්ඨිතයට බුදු රාජාණන් වහන්සේ පැමිණ දහම් දෙසූ කල්හි එහි රැස්වූයේ බ්‍රාහ්මණ වංශික පිරිසක් බවත් ඒ අතර රට්ඨපාලද සිටි බවත් සූත්‍රයේ සඳහනි.

3. Malalasekara, G.P., **Dictionary of Pali Proper Names**, London, 1938, 706 පිටුව

වෙනත් කිසියම් ප්‍රධාන චරිතයක් අළලා එසේ කර ඇති බව දැකිය හැකිය. ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ චරිත ඉස්මතු වන දීඝනිකායේ පායාසිරාජඤ්ඤ (කුමාරකස්සප තෙරණුවෝ) මජ්ඣිමනිකායේ අනඞ්ගන (සාරිපුත්ත තෙරණුවෝ) චුල්ලවේදල්ල (ධම්මදින්නා තෙරණිය) මහා වෙදල්ල (සාරිපුත්ත තෙරණුවෝ) ආදී දාර්ශනික වශයෙන් වැදගත් සූත්‍ර අතළොස්සක් අතරින් මෙම සූත්‍රය ද සුවිශේෂී එකකි. රට්ඨපාල චරිතය ආදි බෞද්ධ සම්ප්‍රදාය අපේක්ෂා කළ උත්කෘෂ්ට භික්ෂු චරිතාදර්ශයක් වූ නිසා සූත්‍රයේ රට්ඨපාල තෙරණුවන්ගේ චරිතයට ද වැඩි ඉඩ කඩක් ලැබී තිබේ. ධර්මය පිළිබඳ විශේෂඥ දැනුමකින් සමන්විත වූ තෙරවරුන්ගේ හා තෙරණියන්ගේ දේශනා ද බුද්ධ භාෂිත ලෙස විශ්වාසනීයත්වයෙන් හා ගෞරවයෙන් යුතුව ස්මෘති ශක්තියෙන් පවත්වාගෙන එනු ලැබිණි. බුදුන් වහන්සේගේ නොවන දේශනයක් සූත්‍රයක සංගෘහිත වේද, එම දේශනය බුද්ධ වචනය පිළිබඳ විශිෂ්ට ඥානයක් තිබූ තෙරනමකගේය. එවැනි සූත්‍ර ධර්මයන්හි බොහෝ සෙයින් බෞද්ධ දර්ශනයේ ගැඹුරු ධර්ම පර්යායන් අන්තර්ගත වීමෙන්ද මේ කරුණ ස්ඵුට වේ.

ඒ ඒ අවස්ථාවන්හි දී ශාස්තෘන් වහන්සේ හා ශ්‍රාවකයන් වහන්සේලා විසින් කළ දේශනා ඓතිහාසික සන්දර්භ සහිතවම සූත්‍ර වශයෙන් සංගෘහිත කර ස්මෘති ශක්තියෙන් පවත්වාගෙන ඒම මගින් අතීත ථේරවාද භික්ෂු සම්ප්‍රදාය සිදුකර ඇති උත්කෘෂ්ට වූ කාර්ය භාරය රට්ඨපාල වැනි සූත්‍රයකින් වෙසෙසින් හඳුනා ගත හැකිය. රට්ඨපාල සූත්‍රයේ ඍජුව බෞද්ධ දර්ශනය හා සම්බන්ධ වන දේශනාව ඉතා කෙටිය. සූත්‍රයේ අවසානයේ දැක්වෙන පරිදි ථුල්ලකොට්ඨිතයේ කෝරව්‍ය නම් රජුගේ මිගාචීර උයනේදී හමුවන එකී කෝරව්‍ය රජුට දේශනා කරන ධර්මයේ හරය වාක්‍ය හතරකට පමණක් සීමාවේ. නමුත් එය සංක්ෂිප්ත වූද සාරගර්භ වූද දේශනයකි. එම දේශනාවට සූත්‍රයේ ඓතිහාසික සන්දර්භයෙන් වැටෙන ආලෝකය ඉමහත්ය. බෞද්ධ භික්ෂු සම්ප්‍රදාය පිළිබඳ කිසිදු අවබෝධයක් නැති කාමභෝගී පාලකයෙකු



වඩාත් උචිත වන අයුරින් ස්වකීය දේශනය සිදු කර ඇති බව පසක් වන්නේ සූත්‍රයේ මේ ඓතිහාසික සන්දර්භයේ ආලෝකය නිසාය.

අසූ මහා ශ්‍රාවකයන් වහන්සේලා අතරින් රට්ඨපාල තෙරණුවෝ ශ්‍රද්ධාවෙන් ගිහිගෙය හැරපියා පැවිදි වූ භික්ෂූන් වහන්සේලා අතර අග්‍රස්ථානය ලැබූ බව ඒතදග්ගපාලියේ දැක්වේ.[4] පිටක-පාලියේ රට්ඨපාල හිමියන්ගේ නම හමුවන්නේ විරල වශයෙන් වුවත් උන්වහන්සේ බුද්ධකාලීන ධර්මප්‍රචාරක ක්‍රියාවලියේදී සුවිශේෂී කාර්යයක් ඉටුකළ තෙර නමක් වූ බව සිතන්නට කරුණු මෙම සූත්‍රය තුළම සටහන් වී ඇත. තෙරණුවෝ උසස් ධනවත් හා කුලවත් පවුලක බුද්ධිමත් තරුණයෙකු වූ බව පැහැදිලිය. ලමොතේ සඳහන් කරන පරිදි බෞද්ධ භික්ෂු සමාජය තුළ කුල ක්‍රමයක් නොපැවතියත් බුදුරාජාණන් වහන්සේ උසස් වංශවත් පවුල්වල තරුණයන් ශාසනයට ඇතුළත් කර ගැනීමට ප්‍රිය කළහ.[5] මෙහිදී ඔහුගේ ප්‍රකාශයට පාදක වී ඇත්තේ ශාසන බ්‍රහ්මචර්යාවට ඇතුළත් වන පුද්ගලයන්ගේ බ්‍රහ්මචාරී ජීවිතයේ ආරම්භය පිළිබඳ සඳහන් කෙරෙන තැන්හි බොහෝ සූත්‍රවල ඇති 'කුලපුත්ත' යන වචනයයි. පොල්වත්තේ බුද්ධදත්ත නාහිමියෝ ද මේ වචනයට අර්ථ දක්වා ඇත්තේ 'සෑහෙන පවුලක පුත්‍රයෙක්' යනුවෙනි.[6] කෙසේ නමුත්, කුල යන්නෙන් ඕනෑම කුලයක් අර්ථවත් විය හැකිය. (නා නා කුලා). එබැවින් මෙම වචනයෙන් බුදුරජාණන් වහන්සේ උසස් කුලවත් තරුණයන්ම අදහස් කළ සේක්ය යන යන ලමෝතේගේ අදහස පිළිගැනීමට අප එකඟ නොවන මුත් ඔහුගේ අදහසේ සැලකිය යුතු කරුණක් තිබේ. එනම් වංශවත් පවුල්වල තරුණයන් ශාසන බ්‍රහ්මචර්යාවට ඇතුළත් වීම භික්ෂු සමාජය කෙරෙහි වඩා ප්‍රතිඵලදායී ආකර්ශනයක් ඇති වීමට හේතුකාරක වන්නට ඇති

[4] අඞ්ගුත්තරනිකාය 1, 48 පිටුව "එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං සද්ධා පබ්බජිතානං යදිදං රට්ඨපාලො"

[5] LAMOTTE, ETIENNE, **HISTORY OF INDIAN BUDDHISM: FROM THE ORIGINS TO THE SAKA ERA** (Trans. From French by SARA WEBB-BOIN), University Catholique De Lounain, Louvain-La-Neuve, 1988, 55 පිටුව

[6] බුද්ධදත්ත නාහිමි, පොල්වත්තේ, පාලි- සිංහල ආකාරාදිය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 1998, 164

02 MAY 2012

බවයි. බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය හා වෛශ්‍ය කුලවලට අයත් උසස් කුලවත් පවුල්වල සමාජිකයන්ට තිබූ සමාජ තත්වය හා ඔවුන් ලබා තිබූ උගත්කම නිසා බෞද්ධ ඉගැන්වීම් ප්‍රචාරය කර හැරීමේදී උන්වහන්සේලාගෙන් සුවිශේෂී දායකත්වයක් ලැබිණි. විශේෂයෙන් සමකාලීන උසස් සමාජය කෙරෙහි බලපෑමක් ඇති කිරීමේ පහසුව ඔවුන් කෙරෙහි විය. ඒතදග්ගපාලියේ එන සුවිශේෂී කුසලතා ප්‍රකට කළ තෙරවරුන්ගෙන් බොහෝ දෙනා උසස් කුලයන් නියෝජනය කළ තෙරවරු වූහ. මිනිස් ලොව ඉපදීමට පෙර බෝසතාණන් වහන්සේ තුසිත දේවකායෙහි සිට පංච මහා විලෝකනය කළේය යන පුවත තුළින් ගම්‍ය වන්නේ ද කුලය හා වංශයේ ප්‍රායෝගික වැදගත්කමයි. ආදී බෞද්ධ මූලාශ්‍ර අනුව බුදුන් වහන්සේ වංශවත් කුලයක සාමාජිකයෙක් වූ අතර එය උන්වහන්සේගේ ධර්මප්‍රචාරක ක්‍රියාවලියේදී අතිරේක වාසියක් වූ බව ද බුද්ධ චරිතය විමසීමෙන් පැහැදිලි වේ.

උසස් කුලවත් පවුලක සාමාජිකයෙකු ප්‍රව්‍රජ්‍යා ජීවිතයක් ගෙවනු දැකීම බෞද්ධ භික්ෂු සමාජය පිළිබඳ අවබෝධයක් නැත්තෙකුට මහත් කුතුහලයක් දනවන කරුණක් විය. සිද්ධාර්ථ තාපසයන් වහන්සේ එකුන්තිස් වියැති තරුණයෙක්ව ප්‍රව්‍රජ්‍යාව ලැබ මගධයේ සැරිසරද්දී මිනිසුන් තුළ වූ කුතුහලය මහාවග්ගපාලියේ සඳහන්වේ. ධනවත් පවුලක තරුණයෙක් වූ රට්ඨපාල ප්‍රව්‍රජ්‍යාවට ඇතුළත් වූයේ මන්ද යන කරුණ සම්බන්ධයෙන් ජනයා තුළ පැවති කුතුහලය කෝරව්‍ය රජු ස්වකීය අඹ උයනේ දී රට්ඨපාල තෙරුන් හමුවන අවස්ථාවේදී උන්වහන්සේගෙන් අසන පැණයෙන්ම පැහැදිලි වේ. කෝරව්‍ය රජ රට්ඨපාල තෙරුන් වෙත එළඹෙන්නේ පෙර සිට පැවැති දැන හැඳුනුම්කම් පෙරදැරිවය. රජ තෙරුන්ගෙන් අසන්නේ මහළු බව, ශාරීරික සුවය පිරිහීම, දුගී බව, ඥාති වර්ගයාගේ පිරිහීම යන කරුණු කිසිවකින් පීඩා නොවිඳින කල්හි පැවිදි වූයේ කවර හේතුවක් නිසාද යන්නයි. රජුගේ අදහස හා අත්දැකීම පරිදි එවක ප්‍රව්‍රජ්‍යාවට පත්වූ බොහෝ දෙනා මෙවැනි හේතු වලින් පීඩාවට පත් වූ අය බව රජුගේ ප්‍රකාශයෙන් පැහැදිලි වේ. සමකාලීන වෙනත් ශ්‍රමණ සම්ප්‍රදායන් හා බෞද්ධ ශ්‍රමණ



සම්ප්‍රදායේම තත්වය විමසීමේදී වුව ද මෙය සත්‍ය කරුණකි. එහෙත් මුල් යුගයේ භික්ෂු සංස්ථාවට ඇතුලත් වූ බොහෝ දෙනා ජීවිතය පිළිබඳ අවබෝධයකින්ම පැවිදි වූ අය වූහ. බොහෝ සූත්‍රවල සඳහන් පරිදි ඔවුහු ප්‍රව්‍රජ්‍යා ජීවිතයේ හරය තේරුම් ගෙන පැවිදි දිවියේ සිට රැකිය යුතු ශික්ෂා ගිහිව සිට රැකිය නොහැකි බව අවබෝධ වීමෙන් පැවිද්ද කැමති වූ අය වූහ.[7] ඔවුනතර වූ උසස් කුලයේ සාමාජිකයන් පැවිදිව සිටිනු දැකීමෙන් කාමභෝගී සාමාන්‍ය ජනයා තුළ යම් විමතියක් හා ආකර්ශනයක් ඇති විය. විශේෂයෙන් බාහිර ස්වරූපයෙන්ම ප්‍රසන්නවූ භික්ෂූන් වහන්සේලා නිසා මේ කුතුහලය තීව්‍ර විය. දහම් ඇසීමෙන් උන්වහන්සේලා ආධ්‍යාත්මික තත්වය පිළිබඳ පැහැදීමක් ඇතිවිය.

රට්ඨපාලට බුදුරජාණන් වහනසේ හමුවන්නේ උන්වහන්සේ ථුල්ලකොට්ඨිතයට පැමිණි අවස්ථාවකදීය. බුදුරජාණන් වහන්සේගෙන් දහම් ඇසූ රට්ඨපාල පැවිදි වීමට අවසර ඉල්ලීය. ඒ සඳහා මාපියන්ගේ කැමැත්ත ලැබිය යුතු බව බුදුරජාණන් වහන්සේ දැන්වූහ. මහා ධනවතෙක් වූ රට්ඨපාලගේ පියා තමන්ගේ එකම දරුවා වූ රට්ඨපාලට පැවිදි වීම සඳහා අවසර දීමට එකඟ නොවීය. පියාගේ අවවාදය වූයේ තරුණ වියේදී හැකි තරම් සැප සම්පත් අනුභව කරමින් පිං දහම් කරමින් ජීවත් වන ලෙසයි. සුව පහසු දිවියක් ගත කළ රට්ඨපාලට පැවිදි ජීවිතය උචිත නොවන බව ඔහු පෙන්වා දුන්නේය. මේ සියල්ලට වඩා සාමාන්‍ය සම්මතය පරිදි තම පරපුර හා දේපළ සම්බන්ධ අනාගත උරුමකරුවා වූ රට්ඨපාල පැවිදි වීමට අවසර ඉල්ලීම ඔහුට ඉවසිය හැකි කරුණක් නොවූ බව පැහැදිලිය.

පියාගේ යෝජනාවට අකමැති වූ රට්ඨපාල ආහාර ගැනීම වර්ජනය කළේය. රට්ඨපාලගේ යහළුවන් ලවා ඔහුට කරුණු කියවන්නට දෙමවුපියෝ උත්සාහ කළ නමුත් එයින්ද ප්‍රතිඵලයක් වූයේ නැත. කෙසේ නමුත්, අවසානයේදී දෙමවුපියන්ගෙන් අවසර ලැබුණු අතර බුදුරජාණන්

[7] දීඝනිකාය 1, 63 පිටුව, රට්ඨපාල සූත්‍රය හා වෙනත් බොහෝ සූත්‍ර, "නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකනත පරිපුණ්ණං එකනත පරිසුදධං සංඛලිඛිතං බ්‍රහමචරියං චතුරිං"

වහන්සේ වෙත ගොස් පැවිදි විය. බුදුරජාණන් වහන්සේ හා සැවැත් නුවරට ගොස් එහිදී බවුන් වඩා රහත් විය.

රහත් බව ලැබූ රට්ඨපාල තෙරණුවෝ ස්වකීය ජාත භූමියට යෑම සඳහා බුදුරජාණන් වහන්සේගෙන් අවසර ඉල්ලූහ. එහිදී බුදුරජාණන් වහන්සේ තෙරණුවන්ගේ චෙතොපරිවිතර්කයන්[8] සිතින් විමසා තෙරණුවන් යළි ගිහි බවට පත්වීමට අවස්ථාවක් නැත්තේ යැයි තහවුරු කරගත් කල්හි එහි යාමට අවසර දුන්හ. බුදුරජාණන් වහන්සේ ඒ වන විට රහත් බව ලබා සිටි තෙරණුවන්ගේ චෙතොපරිවිතර්කයන් විමසූයේ ඇයිදැයි යන්න විමසිය යුතුය. අර්හත්වයට පත් වූ අයෙක් යළි පිරිහී යාමේ අවධානමක් ඇති බැවින් බුදුරජාණන් වහන්සේ තෙරණුවන්ගේ චේතොපරිවිතර්කයන් විමසුවේ ද යන්න මෙහිදී උද්ගත වන ගැටළුවයි. එහෙත් ථේදවාද බුදු සමයට අනුව රහත් බව ස්ථිර වූ නොපිරිහෙන තත්වයක් වන අතර එය බොහෝ සූත්‍රයන්හි අවධාරණය කර ඇත. රහතන් වහන්සේට රාග, දෝස, මෝහ, මාන මුලිනුපුටා දැමූයේ යළි නූපදින පරිදි ප්‍රහීණ යයි දක්වා තිබේ.[9] මේ අනුව අපට සිතිය හැක්කේ රට්ඨපාල තෙරණුවන් රහත් බව ලබා සිටිය ද ඒ බව බුදුරජාණන් වහන්සේ නොදැන සිටි බවයි. ඇතැම්විට තෙරණුවෝ රහත් බව ලබා ඒ බව බුදුන් වහන්සේට දැන්වූයේත් ජාත භූමියට යාමට අවසර ඉල්ලූයේත් මේ හමුවීමේදී විය හැකිය. එබැවින් බුදුන් වහන්සේ තෙරණුවන්ගේ රහත් බව තහවුරු කරගන්නට උන්වහන්සේගේ චේතෝපරිවිතර්කයන් විමසූ බව සිතිය හැකිය. වෙනත් අයෙකුගේ චේතෝපරිවිතර්කයන් විමසිය හැකි චෙතොපරිය වැනි අභිඥාවන් නිරන්තරයෙන් ක්‍රියාත්මක නොවන බව බුදුන් වහන්සේ පෙන්වා දුන්හ.[10] ඒවා අවධානය හා චිත්තේකාග්‍රතාව තුළින් ක්‍රියාත්මක කළ යුතු බවත් සූත්‍රාගත අදහසයි.

[8] 'චෙතොපරිවිතක්ක' යන්නට දිය හැකි නිශ්චිත සිංහල අර්ථයක් නොපෙනේ. කිසියම් මොහොතක යම් අයෙකුගේ සිත තුළ ගොඩනැගෙන සවිඥ්ඥාණික වූද අවිඥ්ඥාණික වූ මනෝභාවයන් සමුදායක් ලෙස අර්ථ දැක්විය හැකිය.

[9] 'උච්ඡින්න මූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාද ධම්මා' බලන්න, සංයුත්තනිකාය IV, 544 පිටුව (ගෝදත්ත සූත්‍රය)

[10] මජ්ඣිමනිකාය 2, 252/253 පිටුව



මේ අනුව, උක්ත අවස්ථාව වන විටත් බුදුන් වහන්සේ තෙරණුවන් රහත් ඵලය ලබා සිටි බව නොදැන සිටි සේක්ය යන්න තීරණය කළ හැකිය.

මාර්ගඵලයන්ගෙන් නොපිරිහෙන බව ථේරවාදී සම්ප්‍රදායානුගත පිළිගැනීම වූවත් ලැබූ රහත් බව පිරිහීමට අවකාශ තිබෙන බවට ඉඟි පෙළ සාහිත්‍යය තුළම අන්තර්ගත බව සඳහන් කළ යුතුය. මජ්ඣිමනිකායේ අනඞ්ගන සූත්‍රයේ මෙම අදහස ප්‍රකාශ වේ. මෙම සූත්‍රයේ සාරිපුත්ත තෙරණුවන් පුද්ගලයන් සතර දෙනෙකු[11] පිළිබඳව සඳහන් කර ඇති අතර ඉන් එක් අයෙක් (තුන්වැන්නා) තමන් කෙළෙස් රහිත වූ නමුත් (අනඞ්ගන) ඒ බව නොදැන[12] අරමුණු සුබ වශයෙන් මෙනෙහි කිරීමෙන් රාග, දෝස, මෝහ සහිතව කලුරිය කරන බව සඳහන්ය. සතරවැන්නා කෙලෙස් රහිත වූයේ (අනඞ්ගන) ඒ බව දැන අරමුණු සුබ වශයෙන් මෙනෙහි නොකිරීමට ප්‍රවේශම් වෙයි. මේ පිළිබඳව විස්තර කරන අටුවාවේ මතය නම් මේ තැනැත්තා වික්ඛම්භන වශයෙන් කෙලෙසුන් නැසූ තැනැත්තෙක්ය යන්නයි. මේ අටුවා මතය සම්බන්ධයෙන් විචාරයක යෙදෙන හේන්පිටගෙදර ඤාණසීහ හිමියන් පවසන්නේ මේ පුද්ගලයන් සතර දෙනාගෙන් අවසාන දෙදෙනාම අනඞ්ගන වශයෙන් හඳුන්වා ඇති හෙයින් එක් පුද්ගලයෙක් පමණක් (වික්ඛම්භන වශයෙන් කෙලෙසුන් නැසූ) වෙනස් මට්ටමක අයෙක් ලෙස තීරණය කිරීම යුක්ති යුක්ත නොවන බවයි.[13] එසේ සැලකීමේදී මේ දෙදෙනාගේ වෙනස කෙලෙස් නැසූ බව දැන සිටීම හා නොදැන සිටීම බව පිළිගන්නට සිදුවේ.

අර්හත්වය පිළිබඳ අදහස් දැක්වෙන නොයෙක් තැන්හි කෙලෙසුන් මිදුනු කල්හි කෙලෙසුන්ගෙන් මිදුනු බව දන්නා නුවණ

[11] මජ්ඣිමනිකාය I, 56/57 පිටුව

[12] "යවායං පුගගලො අනඞ්ගනොව සමානො නතථි මෙ අජ්ඣතතං අජඣතනත යථාභූතං නප්පජානාති"

[13] ඤාණසීහ හිමි, හේන්පිටගෙදර, මහ රහතන් වහන්සේ, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, 1962, 99-100 පිටු

පහළ වන බව කියවේ (විමුත්තසමිං විමුත්තමිති ඤාණං හොති) මෙවැනි ඤාණයක් පිළිබඳ වෙසෙසා දක්වා ඇත්තේ ඇයි? ඇතැම් විට ඤාණය අර්හත් මාර්ගඵල ලැබූ යම් අයෙකුට පහළ නොවීමට ඉඩ ඇති නිසා විය යුතුය. එම පුද්ගලයා (අනඞ්ගන) සූත්‍රයේ සඳහන් කෙලෙස් නැසූ නමුත් ඒ බව නොදන්නා පුද්ගලයා විය හැකිය. එසේ නම් ලැබූ අර්හත් බවෙන් පිරිහීමට ඉඩ ඇත්තේ මේ ඤාණය නොමැති වීමෙන් අරමුණු කෙරෙහි ප්‍රවේසම් සහගත නොවීමෙනි. මහත් අධ්‍යාත්මික ශික්ෂණයකින් නික්ලේශී තත්වයට පත් උතුමෙකු යළිත් අරමුණු සුබ වශයෙන් සැලකීමට පෙළඹීමෙන් පිරිහීමට පත්වීම අපේක්ෂා නොකළ හැකි මුත් එසේ පිරිහීමට ඉඩ පවත්නා බව මේ සූත්‍රය අනුව සිතීමට සිදු වේ.

තෙරණුවෝ බුදුරජාණන් වහන්සේගෙන් අවසර ගෙන ථුල්ලකොට්ඨිතයට පැමිණියා හ. පිඬුසිඟා යන්නේ දිනක් ස්වකීය පියාගේ නිවස අසලට පැමිණියේය. බ්‍රාහ්මණයා දුර සිටම තෙරණුවන් දුටු නමුත් භික්ෂුවක් බව මුත් ස්වකීය පුත්‍රයා බව හඳුනා නොගත්තේය. තමන්ගේ ප්‍රිය වූ මනාප වූ එකම පුත්‍රයා ශ්‍රමණයන් විසින් තමාට අහිමි කළේ යැයි පවසමින් බමුණා විසින් කළ ආක්‍රෝශ විනා තෙරණුවෝ බමුණාගෙන් දත් නොලද්දාහ. විශේෂයෙන්ම අගාරික සම්ප්‍රදායික බමුණෝ ශ්‍රමණභාවය තුළ හරයක් නොදැක්කාහ. ඔවුහු බුදුරජාණන් වහන්සේට වෙත කළ ප්‍රබල චෝදනාව වූයේ භික්ෂු ව්‍යාපාරය පවුල් සංස්ථාව විනාශ කරන භාර්යාවන් ළමුන් අනාථ කරන ව්‍යාපාරයක් බවයි.[14] පිළුණු අහරක් විසි කිරීමට ගෙයින් පිටතට එන පිය බමුණාගේ ගෙයි දාසියගෙන් කැමති නම් ඒ ආහාරය දුන මැනවැයි ඉල්ලන තෙරණුවන් රට්ඨපාල බව දාසිය හඳුනා ගත්තාය. පැමිණි ශ්‍රමණයන් වහන්සේ ස්වකීය පුත්‍රයා බව දැනගත් බමුණා තෙරණුවන් පිළුණු ආහාරය වළඳන තැනට ගොස් ගෙට වඩින ලෙස ඉල්ලීය. තමන් බත් කිස නිමවූ බව දන්වන තෙරණුවෝ එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළහ. පසුදින ගෙදරට දනට වඩින ලෙස බමුණා කළ ඉල්ලීම උන්වහන්සේ පිළිගත්හ.

14 මනුසසා උජ්ඣායනත, ඛීයනත, විපාචෙනත, අපුත්තකාය පටිපන්නෙනා සමණො ගොතමො වේධව්‍යාය පටිපන්නෙනා සමණො ගොතමො කුලූපච්ඡෙදාය පටිපනෙනා් සමණො ගොතමො... විනය 1, 43



බමුණාගේ දැඩි අරමුණවූයේ තෙරණුවන් යළිත් ගිහි ජීවිතයට පොළඹවා ගැනීමයි. යම් හෙයකින් පැවිද්දෙහි සිත නොඅළවන්නේ නම් යළිත් පුත්‍රයා මේ ජීවිතයට පෙරළා එනු ඇත යන්න පැවිදි වීමට අවසර දෙන මොහොතේ බමුණා තුළ වූ සිතුවිල්ලකි. ඊළඟ දිනයේ ගෙදරට එන තෙරණුවන්ට ස්වකීය පරම්පරාගත ධනය පෙන්වීමෙන්ද වස්ත්‍රාභරණයෙන් සැරසී ගත් තෙරණුවන්ගේ ගිහි කල භාර්යාවන් ඔබ වෙත සමීප කරවීමෙන්ද බමුණා තම අරමුණ ඉටු කර ගැන්නට දැඩි පරිශ්‍රමයක යෙදුනේය. ප්‍රව්‍රජ්‍යා ශීලය හැරදමා ගිහිබවට පැමිණ සම්පත් අනුභව කරමින් පින් දහම් කරන්නැයි (එවං සික්ඛං පච්චක්ඛාය) හීනායාවත්තත්වා භොගෙ ච භුකජසසු පක්‍දක්‍දානිච කරොහි) බමුණා ඉල්ලා සිටියේය. තමන්ගේ වචනය පිළිගන්නේ නම් එම ධනය කරත්තකය පටවාගෙන ගොස් ගඟක බහාලන ලෙස තෙරණුවෝ පියාට දැන්වූහ. පිය බමුණා විසින් දුන් උපදෙස් අනුව සැරසී තෙරණුවන් වෙත පැමිණි තෙරණුවන්ගේ පෙර බිරින්දෑවරු උන්වහන්සේගේ පා අල්වාගෙන අප හැරදා ගොස් කවර සුරවමියන් පතන්නේදැයි අසමින් උන්වහන්සේගේ පා පිරිමදින්ට වන්හ. එවිට තෙරණුවෝ ඔවුනට 'නැගණියනි' යනුවෙන් ආමන්ත්‍රණය කළහ. පෙර බිරින්දෑවරුන් වූ තමන්ට තෙරණුවන් එසේ ආමන්ත්‍රණය කරන කල්හි ඔවුහු වික්ෂිප්ත වූහ. ඔවුන්ගේ ක්‍රියා කලාපයෙන් තමා තුළ රාගික හැඟීමක් පහළ නොවූ බවත් ගිහියෙක්ව සිටියදී පැවති සම්බන්ධතා දැන් වලංගු නොවන බවත් තෙරණුවෝ එලෙස ඇඟවූහ. මේ රංගන මධ්‍යයේ තමන්ට කැමති නම් අහර දුන මැනවැයි තෙරණුවන් කළ ඉල්ලීම පරිදි බමුණා තෙරණුවන්ට දානය පිළිගැන්වීය. දානය වළඳා තෙරණුවෝ සියළු වස්තූන් පිළිබඳ අනිත්‍යතාවත්, සම්පත්වල නිස්සාරත්වයත්, සුන්දරත්වයේ අනිටු පළත් දක්වමින් දහම් දෙසූහ. දහම් ඇසීමෙන් තෙරණුවන්ගේ ඤාතීන් කිසිවකු ඒ දහම වෙසෙසා තේරුම් ගත් බවක් සඳහන් නොවේ. ඔවුන් ව්‍යාකූලත්වයට පත්ව සිටීම ඊට හේතු වන්නට ඇත. ස්වකීය අළුත් ජීවිතයේ පරමාර්ථයන් හා ආකල්පවල ස්ථාවර බව හා බමුණා ඇතුළු ඤාතීන්ගේ ලෞකික වූ අපේක්ෂාවන් තමන් කෙරෙන් ඉටුවීම අපේක්ෂා

2012

නොකළ යුතුය යන්න අවධාරණය කරවීමත් ඔවුන් තුළ ආකල්පමය වෙනසක් ඇති කිරීමත් තෙරණුවන්ගේ අදහස වන්නට ඇත. තෙරණුවන්ගේ දේශනය දැක්වෙන්නේ ගාථා ස්වරූපයෙනි. එම ගාථා තෙරණුවන් විසින්ම දේශනා කළ බව සූත්‍රයේ සඳහනි. ගාථා ස්වරූපයෙන් ඒ මොහොතේදී තෙරණුවෝ මෙම ධර්මය දේශනා කළ සේක්ය යන්න සැබෑ තත්වය විය නොහැකි අතර මෙය අප පසුව විස්තර කරන ආඛ්‍යානමය රචනා ශෛලියෙහි ලක්ෂණයක් විය හැකිය.

සූත්‍රය මේ සිද්ධි පෙළ තුළින් ලෞකික ලෝකයේ මිථ්‍යාවන් පිළිබඳ ගැඹුරු අවබෝධයෙන් ලෞකික ජීවිතයෙන් වෙන්ව ලෝකෝත්තර නිවන පසක් කළ උතුමෙකුගේ නිවුනු ජීවිතයක මහිම ගෙනහැර දක්වයි. සුඛපරමවාදීව සිතන ඥාතීන්ගේ තමා කෙරෙහි වූ ලෞකික අපේක්ෂාවන් උපේක්ෂා සහගතව විඳ දරා ගන්නා අයුරු රහතන් වහන්සේ කෙනෙකුගේ ජීවිතයේ උත්කෘෂ්ට භාවය විදහා දක්වයි. ලෝකෝත්තර අපේක්ෂාවන් අරභයා ප්‍රාරබ්ධ වූවහුගේ ක්‍රියාකාරිත්වය ලෞකික ඇසින් බලන කල්හි ප්‍රශ්නාර්ථවත් විය හැකිය. උදාහරණයක් ලෙස ඉහත අප සඳහන් කර ඇති බමුණන් විසින් භික්ෂු සංස්ථාව වෙත කරන ලද චෝදනාවට අදාළව සලකා බලන්නේ නම්, රට්ඨපාල පැවිදි වීමෙන් ඔහුගේ භාර්යාවෝ වැන්දඹුවන් බවට පත් වූහ. පැරණි ඉන්දියානු සමාජයේ කාන්තාවගේ තත්වය කල්පනා කොට ලෞකික දෘෂ්ටිකෝණයෙන් බැලූ කල්හි මෙසේ භාර්යාව හැර යාම ඔවුනට කරන ලද අසාධාරණයක් ලෙස ද, වත්මන් ඇසින් බලන කල කාන්තා ඓතිවාසිකම් නොසලකා හැරීමක් ලෙස ද පෙනී යා හැකිය. දෙමාපියන්ගේ අවසූරය විනා පැවිද්ද සඳහා අඹුවන්ගේ අවසරය අවශ්‍ය බව සූත්‍රයෙහි සඳහන් නොවේ. විනය පිටකයේ ද (සුද්ධෝදන රජුගේ ඉල්ලීමට අනුව බුදුන් වහන්සේ විසින් පනවන ලද පරිදි) ප්‍රව්‍රජ්‍යා භූමියට ඇතුළත් වීම සඳහා අඹුවන්ගේ අවසර ගත යුතු බවක් සඳහන් නොවේ. වරෙක ඇතැමෙක් දරුවන් සහිත භාර්යාවන් හැර දමා පැවිදි වී ඇත. උදානපාදියේ සඞ්ගාමජී තෙරණුවන් පිළිබඳ පුවත එවැනි සංවේදී කථා පුවතකි. සඞ්ගාමජී පැවිදි වීමෙන් පසුව ඔහුගේ භාර්යාව



සඞ්ගාමජී තෙරණුවන් සොයා අවුත් දරුවා රැකගත නොහැකිව තමන් අසරණව ඇති බව හඟවමින් තමන් පෝෂණය කරන ලෙස බැගෑපත් වෙයි. එහෙත් තෙරණුවන් දරුවා ගැන හෝ තමා ගැන අවධානයක් නොමැති කල්හි ඇය දරුවා ද රැගෙන පිට වෙයි. බුදුන් වහන්සේ සඞ්ගාමජී හිමියන්ට ප්‍රශංසා කරන්නේ ඒ මොහොතෙහි සඞ්ගාමජී හිමියන් යුද්ධයක් ජයගත් බව සඳහන් කරමිනි.[15]

මේ ගැටළුවලට පිළිතුරු සොයන්නට අපට ඒ සිද්ධීන් පිළිබඳ පෙළ සාහිත්‍ය තුළින් ලැබී ඇති තොරතුරු ප්‍රමාණවත් නොවේ. සැබෑ ලෙස ජීවිතයේ ලෝකෝත්තර හරයන් සෙවීමේ උත්සුක වූවෙකු ස්වකීය භාර්යාවන් හෝ දරුවන් සහමුලින් අනාථ කර දමා නොඑසේ නම් ඔවුන් අනාරක්ෂිත තත්වයක සිටියදී ස්වකීය අරමුණ කරා යොමු වේය යන්න අපේක්ෂා කළ හැකි නොවේ.[16] කෙසේ නමුත් ලෝකෝත්තර අරමුණක් සාක්ෂාත් කිරීමට උත්සුක වූවෙකුගේ අලෞකික පරමාර්ථයන් හමුවේ ලෞකික කාරණා පිළිබඳ ආදි බුදු සමය උදාසීන ආකල්පයක් දැරුවේය යන කරුණ ආදි බුදු සමය සම්බන්ධයෙන් එක්තරා දුරකට සාධාරණ බව පෙනෙන්ට තිබේ. කෙසේ නමුත් අප මෙය තේරුම් ගත යුත්තේ එවක පැවති පැරණි අබෞද්ධ ශ්‍රමණ සමප්‍රදායන්හි ප්‍රව්‍රජ්‍යාව ලැබීමේදී පැවති සාමාන්‍ය ක්‍රම පටිපාටිය පිළිබඳ සලකා බැලීමෙනි. අළුතින් බිහි වූ ශ්‍රමණ සම්ප්‍රදායක් වශයෙන් බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදාය වඩා පැරණි ශ්‍රමණ සම්ප්‍රදායයන්ගේ චාරිත්‍ර විධි බෙහෝ සෙයින් අනුගමනය කළේය. ඇතැම්විට බෞද්ධ නොවූ ශ්‍රමණ සම්ප්‍රදායන්ගේ චාරිත්‍රවිධි භික්ෂු සමාජය තුළ ඇති වීම සඳහා බලපෑම් කිරීමක් හා ඒ බලපෑමේ ප්‍රතිඵලයක් ලෙස බෞද්ධ භික්ෂු සංස්ථාවට එම සම්ප්‍රදායන්ගේ චාරිත්‍ර හා අනුගත වීමට සිදු වූ බව පෙනේ.[17] උපෝසථය, වස් විසීම

[15] බුද්දකනිකාය 1, 138-140 පිටු

[16] Asanga Tilakaratne, 'TRYING TO UNDERSTAND THE DONATION OF WIVES AND CHILDREN AND RELATED MATTERS IN THERAVADA BUDDHIST ETHICS' , THE MAHACHULALONKORN JOURNAL OF THE BUDDHIST STUDIES (Vol.1) Mahachulalogkomravidyalaya university, 2008, 82 පිටුව

[17] විශේෂයෙන් ජෛන ශ්‍රමණ සම්ප්‍රදායේ චාරිත්‍ර - ධර්ම බොහෝ සෙයින් ආදි බෞද්ධ භික්ෂු පිළිවෙත් කෙරෙහි බලපා ඇති බව පෙනේ.

වැනි පිළිවෙත් බෞද්ධ භික්ෂු සමාජය තුළ ස්ථාපිත වීම සිදු වූයේ එසේ ගිහි සමාජය විසින් බලපෑම් කරනු ලැබීමේ ප්‍රතිඵලයක් වශයෙනි. එපරිද්දෙන්ම ශ්‍රමණ සම්ප්‍රදායන්ට ඇතුළත් වීමට ඒ ඒ සම්ප්‍රදායන්හි පැවතුනේයයි සිතිය හැකි නිදහස අහේතුකව සීමා කරන්නට බුදුන් වහන්සේට අවශ්‍ය වූයේ නැත. විනය ශික්ෂා පද පැනවීමේදී බුදුන් වහන්සේ තුළ වූ මධ්‍යස්ථ ආකල්පයම මේ තත්වය යටතේ ක්‍රියාත්මක වන්නට ඇත.[18]

පියාගේ ගෙදර සිදුවූ සිද්ධියෙන් පසු තෙරණුවෝ යළිත් කෝරව්‍ය රජුගේ උයනට වැඩියහ. තෙරණුවන් එහි සිටින බව දැන ගන්නා කෝරව්‍ය රජ තෙරණුවන් බැහැදැකීමට උයනට එයි. රාජාභිමාන පරවශ වූ ප්‍රතාපවත් බවින් යුතුව රජ තෙරණුවන් හමුවන්නට පැමිණි අයුරු සූත්‍රයේ සංගෘහිත කර ඇත්තේ කාව්‍යාත්මක භාෂාවෙනි. මෙය ත්‍රිපිටක සාහිත්‍යයේ ආඛ්‍යානමය ස්වරූපයක් ලෙස පෙන්වා දිය හැකිය. ආඛ්‍යානමය ස්වරූපය පිටක සාහිත්‍යාගත රචනා ශෛලියේ සුවිශේෂී ලක්ෂණයකි. එය රට්ඨපාල සූත්‍රයෙහි ද කිහිපලකම දක්නා ලැබෙයි. රට්ඨපාල තෙරණුවන්ගේ පියා පිඩු පිණිස පැමිණෙන රට්ඨපාල තෙරණුවන් හඳුනා නොගෙන හැසිරෙන ආකාරය, රට්ඨපාල පැවිදි වීමට අවසර ඉල්ලූ මොහොතේ ඔහුගේ පියා ප්‍රතිචාර දක්වන විලාශය[19] රට්ඨපාල හිමියන් හඳුනාගත් දාසි තරුණිය එය තෙරණුවන්ගේ මවට

[18] බුදුරජාණන් වහන්සේ නීති පැණවූයේ නීති පැනවීමට අවශ්‍යතාවයක් උද්ගත වූ කල්හිය. පාරාජිකපාළි, 23 පිටුව

[19] රට්ඨපාලට පියා සඳහන් කරන එක් වැකියක අදහස මරණයට වඩා ප්‍රව්‍රජ්‍යාව ලැබීම ඉවසිය නොහැකි බවයි.
'මරණෙනපි තෙ මයං අකාමකා විනා හවිසකාම. කිං පන මයං තං ජීවනතං අනුජානිසසාම අගාරසසමා අනගාරියං පබ්බජ්ජායාති' යන වාක්‍යය බුද්ධ ජයන්ති ත්‍රිපිටක පරිවර්තනයෙහි 'තොපගේ මරණයෙනුදු ඇපි නොකමැත්තෝ වෙම්හ.' කිම ඇලි තොප ජීවත්වන්නවුන් ගිහිගෙන් නික්ම සස්නට පිවිසෙනු පිණිස අනුදනුමෝද' යනුවෙන් පරිවර්තනය කොට දැක්වේ. කාක්කපල්ලියේ අනුරුද්ධ හිමියෝද 'මරණෙනපි තෙ මයං අකාමකා විනා හවිස්සාම' යන පාඨය මෙම අදහසින්ම පරිවර්තනය කර තිබේ. (..... Will Depart unwillingly even at your death) බලන්න. Anuruddha Thera, K., Dictionary of Pali Idioms, THE CHI CHEN NUNNERY, HONG KONG, 2004. 703 පිටුව.



දන්වන අයුරු[20] මව එම කරුණ යළි පියාට දන්වන අයුරු හා රට්ඨපාල හිමියන්ගේ පෙර අඹුවන් අප හැරදා ඔබ කවර සුරවමියක් පතා වෙසෙත් දැයි රට්ඨපාල හිමියන්ගේ පා පිරිමදිමින් අසන අයුරුත්[21] අතිශයින්ම සිත් ගන්නා සුළු අයුරින් සංවාද හා වෘත්තාන්ත කථන ශෛලියකින් ඉදිරිපත් කර තිබේ. එසේම කෝරව්‍ය රජ උයනට එන ආකාරය ද සූත්‍රයෙහි දැක්වෙන්නේ රසවත් වෘත්තාන්ත කථන රචනා ශෛලියකිනි. ආඛ්‍යාන රචනා ශෛලිය වේද, බ්‍රාහ්මණ, ආරණ්‍යක වැනි ප්‍රාග් බෞද්ධ ආගමික සාහිත්‍යයේ සුලභ ලක්ෂණයක් වූ අතර[22] බෞද්ධ සූත්‍ර සාහිත්‍යයෙහි ද අඩු වැඩි වශයෙන් එම ලක්ෂණ දැක ගත හැකිය. මේ අඛ්‍යානමය ස්වරූපය නිසා සූත්‍රයේ අන්තර්ගත ධර්ම පරියායන්ගේ හේතු ඵල සම්බන්ධ පැහැදිලි වන හෙයින් එකී දේශනාවන්ගේ පසුබිම පිළිබඳ යම් වැඩි දැනුමක් අපට ලැබේ. උදාහරණ වශයෙන් කෝරව්‍ය රජ උයනට එන ආකාරයෙන් ඔහු සන්සුන් මනසක් ඇති, දැමුණු, විවේක බුද්ධියෙන් කල්පනා කරන පුද්ගලයෙක් නොවන බව අපට තේරුම් ගත හැකිය. ආඛ්‍යානමය රචනා ශෛලියේ ආස්වාදය ඇතිකරන සිද්ධි නිරූපණය හා දෙබස් මිනිසා තුළ සහජයෙන්ම පවත්නා කථා ඇසීමේ රුචිකත්වය සාර්ථක ලෙස මනෝවිද්‍යාත්මක පදනමකින් සූත්‍ර දේශනාවක් තුළ යොදාගෙන තිබේ.

රට්ඨපාල තෙරණුවෝ රජුට පවසන්නේ තමා බුදුන් වහන්සේගේ ධර්ම-නිර්දේශයන් හතරක් ප්‍රත්‍යක්ෂ වීමෙන් පැවිදි වූ බවයි. මේ කාරණා හතර පැහැදිලි කිරීමම රජුට තෙරණුවන්ගේ ධර්මෝපදේශය වෙයි. මේ කාරණා හතර නම්,

[20] "ආයසමතො රටඨපාලසස ඤාති දාසී යෙන ආයසමතො රටඨපාලසස මාතා තෙනුපසංකම්, උපසංකමිතවා - යගෙසය්‍ය ජානෙය්‍යාසි අයයපුත්තො රටඨපාලො අනුපපතෙතා"

[21] අථඛො ආයසමතො රටඨපාලසස පුරාණ දුතියිකායො පචෙචකං පාදෙසු ගහෙත්‍වා රට්ඨපාලං එතදවොචුං, "කීදිසා නාම තා අයය පුතතක අචඡරායො, යාසං ත්‍වං හෙත බ්‍රහමචරියං චරසීති?"

[22] මකුරුප්පේ ධම්මානන්ද හිමි, 'ත්‍රිපිටකයේ ගද්‍ය පද්‍ය ආඛ්‍යානය පිළිබඳ විමර්ශනයක්', විදසුන (නඳසර උවසර ලිපි සරණිය) පළමු කළඹ, ආදි ශිෂ්‍ය සංගමය, සිරි විජය විදර්ශනා පිරිවෙණ, අනුරාධපුර, 2006, 108-110 පිටු

1. ලෝකය ජරා මරණ දෙකට යයි, ඒ නිසා අධ්‍රැවයි (උපනීයති ලොකො අද්ධුවො)
2. ලෝකය ආරක්ෂා රහිතය, අස්වැසිය හැක්කෙක් නැත (අත්තාණො ලොකො අනභිස්සරො)
3. ලෝකය තමා අයත් දේ රහිතය (අස්සකො ලොකො සබ්බං පහාය ගමනීයං)
4. ලෝකය ඌනය, තෘප්තිය රහිතය, තණ්හාවේ වහලෙකි. (ඌනො ලොකො අතිත්තො තණ්හා දාසො)

රට්ඨපාල තෙරණුවන් රජුට පවසන කාරණා බුදු සමයේ සාමාන්‍යයෙන් පිළිගැනෙන ධර්මතා වශයෙන් සරල දෙසුමක් ලෙස පෙනී ගියද මෙහිදී ඉතා වැදගත් වන්නේ තෙරණුවන් මේ කාරණා බුදුරජාණන් වහන්සේගෙන් තමන් උකහා ගත් අවබෝධය ලෙස රජු සඳහා තෝරා ගෙන පහදා දෙන ආකාරයයි. කෝරව්‍ය රජු අසූවයස් වූ මහල්ලෙක් වුව ද ජීවිතය පිළිබඳ ඔහු තුළ වූ සුඛපරමවාදී බලය හා ආධිපත්‍ය කෙරෙහි නැඹුරු වූ නොදැමුණු චින්තනය සූත්‍රය තුළ ඉස්මතුවී පෙනේ. රජ රට්ඨපාල තෙරණුවන් හමුවූයේද පෙර පැවති දැන හැඳිනීම්කම් නිසා මිස සුවිශේෂි භක්තියකින් වී යයි සිතන්නට කරුණු නැත. මේ නිසා බුදු දහමේ ගැඹුරු ඉගැන්වීම් කෙරෙහි යොමු නොවී ජීවිතයේ යථාර්ථයන් පිළිබඳ ගැඹුරු විඥානයක් නොතිබූ රජුගේ ආකල්පවලට ගැලපෙන පරිදි ස්වකීය දේශනය සකසා ගැනීමට තෙරණුවන් උනන්දු වූ බව පෙනේ. බලය හා ආධිපත්‍ය කෙරෙහි ලොල්වූ පාලකයෙකුගේ ජීවිතයේ අපේක්ෂාව වන උපද්‍රවයකින් තොරව අසීමිතව කම්සැප විඳිමින් නොමැරී සිටීම මිථ්‍යාවක් බව පෙන්වා දෙන්නට උන්වහන්සේ උත්සාහ කළහ. මූලික වශයෙන්, බලයෙන් හා සම්පතින් මත්වූවකු ධාර්මික ජීවිතයකට යොමුවීම අපේක්ෂා කරන්නේ නම් මදයෙන් වැසී ගිය ජීවිතයේ සාමාන්‍ය යථාර්ථය පිළිබඳ අවබෝධයක් ඔහු තුළ ඇතිකළ යුතුය යන්න තෙරණුවන් කල්පනා කරන්නට ඇත. රට්ඨපාල තෙරණුවෝ රජු නිසි ලෙස වටහා ගෙන පොදුවේ මිනිස් සන්තානයේ පවත්නා ආශාවන් හතරක් පිළිබඳ බුදුදහම හඳුනා ගන්නා මිථ්‍යාව පැහැදිලි කර



දුන්හ. එනම්,

1) නොමැරී සිටීමේ අපේක්ෂාව
2) ආත්මාරක්ෂාව
3) අසීමිතව කම් සැපවිඳීම හා
4) අසීමිතව කාම සම්පත් රැස්කිරීම

මේ අපේක්ෂාවන් සම්බන්ධයෙන් බුදු දහම හඳුනාගන්නා මිථ්‍යාව තෙරණුවෝ රජුට පැහැදිලි කළහ. තෙරණුවන් කෙටියෙන් සඳහන් කරන ධම්මුද්දේස හතර මේ අපේක්ෂා හතර හා පිළිවෙළින් සැසඳෙයි.

තෙරණුවන්ගේ සංක්ෂිප්ත ඉදිරිපත් කිරීම විස්තර වශයෙන් දැනගනු රිසිවූ රජුට තෙරණුවෝ ඔහුට විෂය වන ආකාරයෙන් එකී කරුණු පහදා දුන්හ. තෙරණුවෝ විසිපස්වන වියේදී තමන් තුළ පැවති යුද්ධ ශිල්පයෙහි දක්ෂතාවන් හා ශරීර ශක්තිය දැන් ඇත්තේ දැයි රජුගෙන් විමසූහ. (පළමුවන මිථ්‍යාව සනාථ කරමින්) රජ අසූපස් වියැති තමන් යන්නේ රුචි තැන පය තබන්නට පවා බැරි තරම් දුබල වී ඇතැයි පිළිගනියි. (දෙවන මිථ්‍යාව සනාථ කරමින්) කෙතරම් සේනාවක් ඇතත් තමාගේ ශරීරයේ දරුණු වේදනා විඳ ගනු සඳහා සහය කර ගන්නට අයෙක් නැති බවත් (තුන්වන මිථ්‍යාව සනාථ කරමින්) අහසෙහි හා පොළොවෙහි කෙතරම් වස්තු ඇතත් මරණයෙන් මතු ඒවා හැර දමා යන කල්හි වෙනෙකෙක්ම ඒවා භුක්ති විඳින බවත් රජුගේ අත්දැකීමෙන්ම ඔහුට අවබෝධ කර දෙන තෙරණුවෝ මේ සියල්ල මෙසේ වූවත් සත්වයාගේ ආශාවේ සීමාවක් නැතැයි පෙන්වා දුන්හ. (හතරවන මිථ්‍යාව සනාථ කරමින්) මහත් සම්පත් ඇතිව සිටින තමන්ට ඇදහිය හැකි වචන ඇති පුරුෂයෙක් සිවුරඟ සේනාවන්ගෙන් ද, ධාන්‍ය, හිරණ්‍ය, ස්වර්ණ හා හා ස්ත්‍රී යන සැපයන්ගෙන් ආඪ්‍ය ජයගත හැකි රාජ්‍යයක් ඇත්තේ යයි පැවසූව හොත් එය අල්ලා ගන්නට උත්සාහ කරන්නේ නොවේදැයි පැහැදිලි කරන තෙරණුවෝ මේ නිසා සත්වයා සැම කල්හිම ඌනව අතෘප්තිමත්ව සිටින්නේ යයි පහදා දුන්හ. රජ තෙරුන් කෙරෙන් ඉවත්ව

යන්නේ උන්වහන්සේගේ වචනය තමන් විසින් ද පුනරුච්චාරණය කරමින් අනුමත කරමිනි.

හතරවන ධම්මුද්දේසය තෙරණුවන් රජුට ප්‍රකාශ කළ තරමට වඩා ගැඹුරු දහමකි. පුහුදුන් සත්වයා පිළිබඳ මේ කෙටි ඉගැන්වීම ඔහුගේ පැවැත්ම, දුක හා දුකින් මිදී විමුක්තිය සාක්ෂාත් කර ගැනීම පිළිබඳ සමස්ත බුද්ධ දේශනාව හා අදාළ වූ සංක්ෂිප්ත අදහසකි. 'ඌන' හෙවත් අපරිපූර්ණ යන වචනයෙන් සංසාරික සත්වයාගේ ස්වභාවය පිළිබඳ අති සංක්ෂේප වූ ද පරිපූර්ණ වූ ද අර්ථ කථනයක් සපයයි. තණ්හාව පවත්නා තාක් සත්වයා නොපිරිපුන්ය. නොපිරිපුන් බව නිසා සැපයන්ම සොයයි. සාමාන්‍ය මිනිසා අදහස් කරන සැපය තමා අයත් වූ හෝ නොවූ භෞතික වස්තූන් මත රැඳී පවතී. සත්වයා ජීවත් කරවන මෙන්ම සසරසැරි සැරන හේතුව ද නොනැසී පවත්නා මේ සුඛ සහගත යයි උපකල්පනය කරන වස්තු හා සාධක (ආරම්මණ) සෙවීමේ ආශාව හෙවත් තණ්හාවයි. තණ්හාව ඉන්ද්‍රිය ගෝචර ලෞකික, භෞතික හා බාහිර වස්තු හා සාධක සමග බැඳී පවතී. මේ කාරණාවලින් තොර සැපයක් සාමාන්‍ය මිනිසාට සිතා ගැනීමට නොහැකිය. එබැවින් ඔහු තණ්හාව විසින් මෙහෙයවනු ලැබ ඒ වස්තූන් වැඩි වැඩියෙන් සොයයි. ඒ නිසා සත්වයා තණ්හාවේ දාසයෙකි. දාස යන වචනය තියුණු අර්ථයක් ගෙනදෙන අතර සත්වයාගේ පැවැත්මෙහි ලා ඔහුගේ අසරණ බව ඉන් ගම්‍ය වේ.[23]

බුදු දහම මූල හේතුවක් හෝ පළමු හේතුවක් පිළිනොගන්නා මුත් තණ්හාව සත්වයාගේ සාංසාරික පැවැත්මේ සියලු මානසික සාධකයන්ගේ සමස්තය ලෙස දක්වා තිබේ. නිර්වාණය හැඳින්වීම සඳහා බුදුසමයේ 'තණ්හක්ඛය' (තණ්හාව ක්ෂය කළ සත්වයා) යන වචනය භාවිත වන්නේ මේ අර්ථයෙනි. කාම, භව හා විභව යන ප්‍රභේදයන්ගෙන්

[23] නිර්වාණයද එක්තරා සැපයකි. (නිබ්බාණසුඛ) එහෙත් එම සැපය බාහිර වස්තූන් හා තත්වයන් නිසා ඇතිවන ඓන්ද්‍රිය සතුටක් නොවේ. එය අධ්‍යාත්මික තත්වයකි. නිර්වාණ පරායණවීම තණ්හාව මිශ්‍රිත ඓන්ද්‍රිය සන්තුෂ්ටිය සෙවීම පිළිබඳ මූල ධර්මයන්ගෙන් වෙනස් වේ. එහි ලා මිනිසා තණ්හාව මගින් මෙහෙය වූයේ නොවේ.



සමන්වාගත තණ්හාව විසින් සත්වයා මෙහෙයවනු ලැබේ. මේ අදහස වෙනත් වචනවලින් සංයුක්ත නිකායේ එන ගාථාවක එයි. තණ්හාව විසින් ලෝකය (ජීවී සත්වයා) ගෙන යනු ලැබේ. තණ්හාව විසින් ලෝකය අදිනු ලැබේ. එකම ධර්මය වූ තණ්හාව කරණ කොට ගෙන සියලු සත්වයෝ වසඟයට ගියාහුය.[24] සත්වයා පාලනය කිරීමට ඇද බැඳ තබාගන්න රැහැන ඉහත කී ඌන බවයි. මෙම අර්ථ කථනයෙන්ම රට්ඨපාල තෙරණුවන්ගේ බුද්ධ වචනය විග්‍රහ කිරීමේ තීක්ෂණය බව ස්ඵුට වේ. කාම, රූප හා අරූප යන භූමිත්‍රයෝ සුඛ සහගත ආවේදනයන් විඳ ගැනීමට සත්වයා තුළ පවත්නා කැමැත්ත මේ ඌනත්වය හේතු කොටගෙන උපන්නේ වෙයි. අර්හත්වය යනු ඌනත්වය නසාලූ පරිපූර්ණ තත්වයයි. මේ අර්ථකථනය සූත්‍ර පිටකයේ බොහෝ සෙයින් දක්නා ලැබෙන ස්ථාවර වාක්‍ය ඛණ්ඩ ආකාරයෙන් වෙනත් සූත්‍රයක දක්නට නොලැබෙන හෙයින් එය බුද්ධ වචනය හා අනුකූල වූ රට්ඨපාල තෙරණුවන්ගේම අර්ථකථනයක් බව පැහැදිලි වේ. තෙරණුවන් ඉදිරිපත් කරන මේ අවසාන කාරණය රජුට තවදුරටත් ගැඹුරින් කල්පනා කරන්නට අවස්ථාවක් සලසා දෙන්නට ඇත. තමා කෙතරම් දුරට තණ්හාවෙන් මඩනා ලද ජීවිතයක් ගත කරන්නේ ද යන්න පිළිබඳ පුනරාවර්ජනයක් කරන්නට මේ ගැඹුරු ධර්ම පාඨය ඉවහල් වූ බව සිතිය හැකිය. එයම තෙරණුවන්ගේ අපේක්ෂාව වූ අතර බෞද්ධ ප්‍රතිපදාව පිළිබඳ කිසිවක් උන්වහන්සේ මේ මොහොතේදී දේශනා කළේ නැත.

රට්ඨපාල සූත්‍රයෙහි බෞද්ධ අධ්‍යාපනයෙහි ඉතා සුවිශේෂි අංගයක් ද ඉස්මතු වෙයි. එනම් පුද්ගල අධ්‍යාශයන් තේරුම් ගෙන ඉගැන්විය යුතු/දේශනා කළ යුතු කරුණු වර්ගීකරණය කරගෙන ස්වායත්ත

[24] සංයුත්තනිකාය 1, 72 පිටුව (තණ්හා සුත්ත) :
තණ්හාය නීයතී ලොකො - තණ්හාය පරිකස්සති
තණ්හාය ඒක ධම්මස්ස - සබ්බෙව වසමන්වගූ

0 2 MAY 2012

සාක්ෂාත්කරනය සඳහා දේශනාවක් පැවැත්වීමය.[25] බුදුරජාණන් වහන්සේ මේ ඉගැන්වීමේ ක්‍රමයෙහි ආදී කර්තෘවරයෙක් ලෙස හැඳින්විය හැකිය. රට්ඨපාල තෙරණුවෝද එම ඉගැන්වීම් ශිල්පයෙහි විශිෂ්ටයෙක් බව පසක් වේ. රජුට හුරු පුරුදු ඔහුගේ ලෝකයෙන් උදාහරණ සපයා ගනිමින් ලෝකයේ පොදු ධර්මතා පසක් කරදීමත් ස්වයං විවේචනයකට ඉඩකඩ ලබාදීමත් රජු හා කළ සාකච්ඡාවෙන් ඉස්මතු වේ. බ්‍රාහ්මණ වංශිකයෙකු වූ නිසා පැවිදි වන්නට පෙර රට්ඨපාල වෛදික අධ්‍යාපනයක් ලබා තිබෙන්නට ඇත. ඒ දැනුම ඔහුගේ ධර්ම දූත කාර්යයේදී ඉවහල් කරගත් බව සිතන්නට පුළුවන. බුද්ධ කාලීන ධර්ම ප්‍රචාරක කාර්යයේදී ඉහළ සාර්ථකත්වය අත්කර ගත්තාහු බ්‍රාහ්මණ වංශික භික්ෂූන් වහන්සේලාය.[26]

රට්ඨපාල සූත්‍රයෙන් මූර්තිමත් වන්නේ ආදිතම බෞද්ධ භික්ෂු සංස්ථාවේ ස්වරූපය පිළිබඳ යථා තත්වයයි. ආදිතම බෞද්ධ භික්ෂුව පූර්ණ තාපස ජීවිතයක් ගත කළ අතර පිණ්ඩාහාරයෙන් යැපුණු ජීවත්වීම සඳහා ස්ථිර වාසස්ථානයක් නොවූ එසේම අල්ප සමාජ සම්බන්ධතා ඇත්තෙක් හෝ සමාජ සම්බන්ධතාවලින් පූර්ණ වශයෙන් විමුක්ත වූවෙක් විය. භික්ෂූන් පාලනය සඳහා විනය ශික්ෂාපද අවශ්‍ය නොවූයේයයි බුදුන් වහන්සේ වරෙක සඳහන් කරන කාලය වූ මෙවක භික්ෂූන් වහන්සේලා ස්වයං සංයමයකින් යුක්ත වූහ. සුත්තනිපාතයේ අට්ඨක හා පරායන වග්ගවලින් මූර්තිමත්වන භික්ෂුව ද මෙබඳු ස්වරූපයේ අයෙකි. භික්ෂුව කඟවේනෙකු මෙන් හුදකලාව හැසිරෙන බව (එකො චරෙ ඛග්ගවිසාණකප්පො)[27] එහි දක්වා ඇත.

---

25 වීරසිංහ, හෙන්රි, **බුදු දහමින් පිළිබිඹුවන සාමය සඳහා අධ්‍යාපනය** (පරි. වරදිවෙල විජයසුමන හිමි) සර්වෝදය, 2002

26 DAVID, RHYS, **A MANUAL OF BUDDHISM**, New Delhi, 1978, 201-208 පිටු

27 **සුත්තනිපාතපාළි**, 12-22 පිටු (උරගවග්ග, ඛග්ගවිසාණ සුත්ත)